# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2482/09 - 2026 මාර්තු මස 31 වැනි අඟහරුවාදා - 2026.03.31**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙහි පහත උපලේඛනයේ (I) වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩවලට අදාළව එකී උපලේඛනයේ (II) වැනි තීරුවේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයන් යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | | | | *II වැනි තීරුව* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 1. | 08.01 | 0801.11.90 | අනෙකුත් - දිසිදි පොල් | කි.ග්‍රෑමයට රු. 320.00 |
| 2. | 25.01 | 2501.00 | ජලීය ආකාරයේ හෝ එසේ නොවන ආකාරයෙන් වූ හෝ එකතු කරන ලද කැටි නොගැසීම් කාරකයෝ හෝ නිදහසේ පාවීම සඳහා වන ද්‍රව්‍යයන් අඩංගු වන්නා වූ ශුද්ධ සෝඩියම් ක්ලෝරයිඩ් හෝ ලුණු (මේස ලුණු සහ ස්වභාවික තත්ත්වය වෙනස් කළ ලුණු ඇතුළුව); මුහුදු ජලය | |
| | | 2501.00.10 | පාෂාණ ලුණු | කි.ග්‍රෑමයට රු. 40.00 |
| | | 2501.00.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 40.00 |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉහත උපලේඛනයේ දක්වා ඇති ;

(i) සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0801.11.90 යටතේ වර්ගීකරණය වන කැබලි කර වියළන ලද කුරුට්ට සහිත පොල් මද (කොප්පරා නොවන) ආනයනය කිරීමේ දී අදාළ වන කි.ග්‍රෑමයට රු. 320ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කි.ග්‍රෑමයකට රු. 10ක් අයකර ගෙන, ඉතිරි වටිනාකම පොල් සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත ආනයන බලපත්‍ර අවශ්‍යතාවය යටතේ දේශීය වශයෙන් පොල් තෙල් නිෂ්පාදන කාර්යය සඳහා ආනයනය කිරීමේදී අත්හරිනු ලැබිය යුතු ය;

(ii) සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 25.01 යටතේ වර්ගීකරණය වන ලුණු (Sodium Chloride BP) ආනයනය කිරීමේ දී අදාළ වන කි.ග්‍රෑමයට රු. 40ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කි.ග්‍රෑමයකට රු. 10ක් අයකර ගෙන ඉතිරි වටිනාකම, සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය මත, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) හෝ ආයුර්වේද කොමසාරිස් ජනරාල් යටතේ ඖෂධ නිෂ්පාදනය කරන ආයතන සඳහා අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරමි.

3. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ වූ ඉහත අංක 1 සහ 2 දරන නියමයන්, එකී පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව 2026 අප්‍රේල් 01 වැනි දින සිට 2026 දෙසැම්බර් 31 වැනි දින දක්වා බලාත්මක විය යුතු ය.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 මාර්තු මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 04 - 0006

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.